

# 2 ප්‍රේමයේ සුරක්ෂිත බව

උත්පත්ති 3:1-13, 3:21

දෙවි සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි දක්වූ අසීමිත වූ ප්‍රේමය නිසා ම තමන් වහන්සේගේ ස්වරූපයෙන් හා සමානත්වයෙන් මනුෂ්‍යයා නිර්මාණය කර, නිදහසේ ජීවත්වීමට අවශ්‍ය පසුබිම සලසා දුන් සේක.

දෙවි සමිඳාණන් වහන්සේ විසින් මනුෂ්‍යයා කෙරෙහි තබන ලද විශ්වාසය හා ලබා දුන් නිදහස මනුෂ්‍යයා කෙලෙස රැකගත්තේ ද යන්න මෙම පාඩමෙන් විමසා බලමු.

ශුද්ධ බයිබලයේ අපට පෙන්වා දෙන ආකාරයට

*දෙවි සමිඳාණන් වහන්සේ ඒදන්හි උයනක් තනා තමන් මැවූ මනුෂ්‍යයා එහි පිහිටෙවූ සේක. තව ද උන්වහන්සේ දැකුම්කලු, ප්‍රණීත පල දෙන ගස් ද, උයන මැද ජීවන වෘක්ෂය ද, හොඳ . නරක අවබෝධ කර ගැනීමේ ගස ද හට ගන්නට සැලැස්වූ සේක.*

*(උත්පත්ති 2 : 8.-9)*

*තව ද උන්වහන්සේ මිනිසාට අණ කරමින් "උයනේ සියලුම ගස්වලින් ගෙඩි කෑමට නුඹට නිදහස ඇත. එහෙත් හොඳ . නරක අවබෝධ කිරීමේ ගසින් පමණක් නොකෑ යුතු ය; නුඹ යම් කිසි දවසක ඒ ගසින් කන්නෙහි ද ඒ දවසෙහි මරණය නුඹට ඒකාන්ත ය" යි වදාළ සේක.*

*(උත්පත්ති 2 : 16-.17)*

ලෝකය නිර්මාණය කිරීමට අදාළ සිද්ධීන් ශුද්ධ බයිබලයෙහි බෙහෙවින් දක්වෙනුයේ සංකේත මගින් ය. ඒ සංකීර්ණ වූ මැවීමේ ක්‍රියාදමය අතීතයේ මනුෂ්‍යයන්හට තේරුම් කරදීමේ හා තේරුම් ගැනීමේ පහසුව උදෙසා විය. මෙහි සඳහන් වන "ජීවන වෘක්ෂය" තබන ලද්දේ මනුෂ්‍යයාගේ පරිපූර්ණ වර්ධනය උදෙසා ය (උත්පත්ති 3:22). "හොඳ-නරක අවබෝධ කර ගැනීමේ ගස" සංකේතවත් කෙරෙනුයේ දේව කැමැත්තයි.

දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයා වෙත හිමි කර දුන් වරප්‍රසාදයක් වනුයේ හොඳ-නරක තෝරා ගැනීමේ නිදහසයි. හොඳ-නරක තීරණය කෙරෙනුයේ දෙවියන් වහන්සේ විසින් ය. නමුත් එය තෝරා ගැනීමේ නිදහස මනුෂ්‍යයා සතු කළ සේක.

හොඳ-නරක       මින් කවරක් මනුෂ්‍යයා විසින් තෝරා ගනු ලැබුයේ ද?

*දෙව් සමිඳාණන් වහන්සේ මැවූ වනයේ සියලු සතුන්ට වඩා සර්පයා උපායෙහි දක්ෂ විය. ඌ ස්ත්‍රියට කතා කොට, "උයනේ කිසි ම ගහක ගෙඩි කන්නට එපා කියා දෙවියන් වහන්සේ කළ තහනම ඇත්ත දැ"යි ඇසී ය. ස්ත්‍රිය සර්පයාට උත්තර දෙමින්, "උයනේ ඕනෑ ම ගහක ගෙඩි කන්නට අපට අවසර ඇත. එහෙත්, උයන මැද තිබෙන ගහේ ගෙඩි කන්නටවත්, ඒවාට අත ගසන්නටවත් දෙවියන් වහන්සේ අපට තහනම් කර ඇත. එසේ කළොත් අප මැරෙනවා ම ය" යි කීවා ය.*

*එවිට සර්පයා පිළිතුරු දෙමින්, "සැබැවින් ම ඔබ මැරෙන්නේ නැත. ඔබ ඒ ගසේ ගෙඩි කන දවසේ දී ඔබේ ඇස් පෑදී, දෙවියන් හා සමාන වී, ඔබත් හොඳ . නරක අවබෝධ කරගන්න බව දෙවියන් වහන්සේ දන්න නිසා එසේ වදාළ සේකැ"යි කීය.*

*ස්ත්‍රිය ද ගස පෙනුමට කෙතරම් රමණීය ද පල කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම ද කියා දුටු විට එයින් ගෙඩි කීපයක් කඩා කෑවා ය. තමා සමග සිටි සිය සැමියාට ද ඉන් සමහරක් දුන් විට ඔහු ද කෑවේ ය. එවිට ඔවුන් දෙදෙනාගේ ම ඇස් පෑදී තමන් නග්න ව සිටි බව ඔවුහු තේරුම් ගත්හ. එබැවින් ඔවුහු අත්තික්කා කොළ එකට මසා ඉණ වැසුම් සාදාගත්හ.*

*ඉක්බිති එදින සිසිල් සුළං හමන සැඳෑ සමයෙහි දෙව් සමිඳාණන් වහන්සේ උයනේ සක්මන් කරන හඬ ඔවුන්ට ඇසී, මිනිසා හා ඔහුගේ භාර්යාව උයනේ ගස් අතර උන්වහන්සේගෙන් සැඟවුණාහ. එහෙත්, දෙව් සමිඳාණන් වහන්සේ මිනිසාට හඬ ගසමින්, "නුඹ කොහේ දැ"යි ඇසූ සේක. "ඔබ වහන්සේගේ කටහඬ උයනේ මට ඇසිණි. එහෙත්, මා නග්න බැවින්, බිය වී සැඟවුණෙමි" යි ඔහු උත්තර දුන්නේ ය. එවිට උන්වහන්සේ, "නුඹ නග්න බව කීවේ කවරෙක් ද? මා නුඹට තහනම් කළ ගසින් නුඹ ගෙඩි කෑවෙහි දැ"යි ඇසූ සේක. ඔහු ද පිළිතුරු දෙමින්, "ඔබ මට සහකාරිය වශයෙන් දුන් ස්ත්‍රිය ඒ ගසේ ගෙඩි කඩා මට දුන්නා ය; මමත් කෑවෙමි" යි පැවසී ය. එවිට දෙව් සමිඳාණන් වහන්සේ ස්ත්‍රියට කතා කොට, "නුඹ මෙය කෙළේ මන්ද" යි ඇසූ සේක. "සර්පයා මා රැවටී ය; මමත් කෑවෙමි" යි ඈ පිළිතුරු දුන්නා ය.*

(උත්පත්ති 3 : 1-13)

මෙහි දී "සර්පයා"ගෙන් "නපුර" සංකේතවත් වන බව පැහැදිලි ය. තහනම් කරන ලද ගසේ ගෙඩි සංකේතවත් කෙරෙනුයේ පාපයයි. එනම් දෙවියන් වහන්සේට අකීකරු වීමයි. සර්පයා හෙවත් නපුරා උපායෙහි දක්ෂ ය. කෙතරම් දක්ෂ වී ද යත් දෙවියන් වහන්සේගේ කැමැත්ත අභිබවා තම කැමැත්ත මනුෂ්‍යයා ලවා ඉටුකරවා ගැනීමට සමත් විය. තහනම් කරන ලද ගසෙහි ගෙඩි අනුභව කිරීමේ හෙවත් පාපය වැලඳ ගැනීමේ ආදීනව මනුෂ්‍යයා දැන සිටියේ ය. එහෙත් මනුෂ්‍යයා තමන්ට මහත් සේ ප්‍රේමකළ දෙවියන් වහන්සේට වඩා සර්පයා හෙවත් නපුරාගේ බස විශ්වාස කළේ ය; දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කර නපුර තෝරා ගත්තේ ය; උන්වහන්සේ ලබා දුන් නිදහස යහපත තෝරා ගැනීමට නොව අයහපත තෝරා ගැනීමට භාවිත කළේ ය. දෙවියන් වහන්සේට යටත් ව අවනත ව ජීවත් වනු වෙනුවට උන්වහන්සේට සමාන වන්නට ආශා කළේ ය.

පාපය තුළ ජීවත් වීම බොහෝ විට රසවත් බව හැඟේ. එයින් මහත් තෘප්තියක් ලද හැකි බව පෙනේ. එනිසා දුබල මනුෂ්‍යයා තමා වෙත පොළඹවා ගැනීමට පාපය සමත් වේ. මෙලෙස පාපය වැලඳ ගත් මනුෂ්‍යයා දේව කැමැත්තට පිටුපා තමන්ගේ වුවමනාවෙන් ම දෙවියන් වහන්සේ වෙතින් බැහැර විය. දැන දැන ම පාපයට යොමු වූ කල දෙවියන් වහන්සේට මුහුණ දීමේ හැකියාව මනුෂ්‍යයා වෙතින් ඉවත් ව යයි. ඔවුන් දෙවියන් වහන්සේ වෙතින් සැඟවීමට උත්සාහ කළේ එහෙයිනි. නමුත් උන්වහන්සේ වෙතින් සැඟවීමට හෝ පලායෑමට හෝ කිසිවෙකුට හැකි නොවේ. "ඔබ මට සහකාරිය වශයෙන් දුන් ස්ත්‍රිය ඒ ගසේ ගෙඩි කෑමට මට දුන්නා ය; මමත් කැවෙමි"යි පුරුෂයා ද, "සර්පයා මා රැවටී ය; මමත් කැවෙමි"යි ස්ත්‍රිය ද පිළිතුරු දුන්න ද, කිසිවෙකු පාපයට පෙළඹී, එහි වගකීම වෙනත් අයෙකු මත පැවරීමට ගනු ලබන උත්සාහයන් දෙවියන් වහන්සේ ඉදිරියෙහි පිළිගැනීමට ලක් නොවන බව පැහැදිලි ය.

මෙලෙස මනුෂ්‍යයා පාපය වැළඳ ගැනීමේ ප්‍රතිඵලය වන්නේ දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් හා සමානත්වයෙන් මවන ලදුව, උන්වහන්සේ සමග සදතන ජීවනයට උරුමකම ලද මනුෂ්‍යයා හට එය අහිමි වීම යි. මරණය හිමි වීමයි.

## පාපය නිසා මනුෂ්‍යයාහට හිමි වූයේ යැයි පැවසෙන මරණය කුමක් ද?

දෙවි සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයා නිර්මාණය කිරීම සඳහා දූවිල්ල භාවිත කළ සේක. දූවිල්ලෙන් නිර්මාණය වූයේ හුදෙක් භෞතික ශරීරය යි. එය ජීවය ලැබූයේ දෙවි සමිඳාණන් විසින් එයට ජීවන හුස්ම හෙළනු ලැබීමෙනි (උත්පත්ති 2:7).

මෙලෙස දෙවි සමිඳාණන් වහන්සේගේ ජීවන හුස්මෙන් පිරිපුන් මනුෂ්‍යයා දෙවියන් වහන්සේ හා සමග සදතන ජීවනයට උරුමකම් ලැබී ය. එහෙත් මනුෂ්‍යයා දෙවියන් වහන්සේ වෙනුවට පාපය තෝරා ගනිමින්, තමන් විසින් ම තමන්ට උරුම වූ සදතන ජීවනය බැහැර කරන ලදි. එනිසා මනුෂ්‍යයා ආත්මික වශයෙන් මරණයට පත්විය. දූවිල්ලෙන් නිමැවූ ශරීරය නැවත දූවිල්ලට හැරෙන්නේ ශාරීරික වශයෙන් සිදුවන මරණයේ දී ය.

දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කර, සදතන දිවිය අහිමි කර ගත් එනම්, ආත්මික මරණය හිමි කර ගත් මනුෂ්‍යයා, තම ශාරීරික මරණය සිදුවන තෙක් දුක් විඳීම උරුමකර ගත්තේ ය. එනම් පෝෂණය උදෙසා පොළොවත් සමග ගැටෙමින් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට සිදුවීම හා කටුපඳුරු - වල් පැළෑටිවලින් එම කාර්යය වඩාත් කටුක වීම අත්දකිමින් පුරුෂයාට ඩහදිය මහන්සියෙන් ආහාර උපයා ගැනීමටත්, ස්ත්‍රිය සැමියාගේ පාලනයට නතු කිරීමත්, දරුවන් ප්‍රසූත කිරීමේ දී විළි රුදාව ඇති වීමත් මනුෂ්‍යයා පාපය නිසා උරුමකර ගත්තේ ය.

මෙලෙස මනුෂ්‍යයා, තමන් විසින් ම වැලඳගනු ලැබූ පාපය හේතුවෙන් දෙවියන් වහන්සේගෙන් ඈත් වුව ද, සදහට ම එහි විපාක විඳිමින් මනුෂ්‍යයා තමන් වහන්සේගෙන් ඈත් කර තබන්නට, ප්‍රේමණීය දෙවි පියාණන් වහන්සේ සූදනම් නොවූ සේක. ඒ මෙලෙසින් ය.

> *"දෙවි සමිඳාණන් වහන්සේ හම් වස්ත්‍ර සාදා ආදම්ට සහ ඔහුගේ භාර්යාවට හැඳවූ සේක"*
>
> (උත්පත්ති 3 : 21)

පාපය නිසා නග්න වූ මනුෂ්‍යයා නැවත යථා තත්ත්වයට පත්කරන්නට දෙවියන් වහන්සේ ගත්තා වූ පියවර මෙයින් ගම්‍ය වේ. මුල දී මනුෂ්‍යයා තමන් විසින් ම කොළ අතු යොදගෙන තම නග්න බව වසා ගන්නට උත්සාහ කළේ ය. එහෙත්, තමන් වහන්සේ පාපයට එරෙහි වුව ද පව්කරුවා ප්‍රතික්ෂේප නොකරන බව සනාථ කරමින් කොළ අතු වෙනුවට සම්වලින් සෑදූ ඇඳුම් යොදා ගනිමින් සුරක්ෂිතතාව වඩාත් තහවුරු කරමින් දෙවියන් වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි පවත්නා අසමසම ප්‍රේමය තව දුරටත් තහවුරු කළ සේක.

**ක්‍රියාකාරකම**

01. දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කර පාපය තෝරා ගැනීම නිසා මනුෂ්‍යයාහට මරණය හිමි විය." මෙය ඔබේ බසින් පැහැදිලි කරන්න.